# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2025

## සිංහල භාෂාව හා සාහිත්‍යය

විභාග අංකය:.................................... නම:...................................................

| 10 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 02යි. |
|---|---|---|

*උපදෙස්*

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 80කි.**

---

**1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) අක්ෂර වර්ගීකරණයට අනුව පහත සඳහන් අක්ෂර හඳුන්වන්න.

(අ) ට , ය (ආ) ප , එ

(ii) පහත සඳහන් වචන යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

(අ) වල (ආ) වළ

(iii) පහත සඳහන් පදවල ප්‍රකෘතිය වෙන් කර දක්වන්න.

(අ) හංසයා (ආ) ලියනවා

(iv) පහත සඳහන් පදවල උක්ත රූප ලියන්න.

(අ) වික්‍රමසිංහයන් (ආ) වාදකයකු

(v) මොනරාගල පළාතේ ප්‍රාදේශීය ජන වහරට අනුව සඳහන් වචනවල අර්ථ හඳුන්වන්න.

(අ) ගහමප (ආ) කුදහප

(vi) පහත සඳහන් වාක්‍යයේ භාවිත සදොස් වචන නිදොස් කර ලියන්න.

"ලක් දෙරණ ආක්‍රමණිකයන්ගේ ග්‍රහනයෙන් මුදවා ගැනීමට තම ධහදිය පමණක් නොව රුධිරය ද හෙලුවෝ බොහෝ වෙති."

(අ) ........................................ (ආ) ..................................................

(vii) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.

(අ) කණ්ඩායමෙන් එක් අයෙක් ත්‍යාගය දිනති.

(ආ) ඔවුන් නිදහස පතා සටන් කළ යුත්තෝ ය.

(viii) පහත සඳහන් යුගල පදවලට සමාන යුගල පද ලියන්න.

(අ) ගරු නම්බු (ආ) අනං මනං

(ix) පොළොවට වැටෙන හැම වැහි බිඳුවක ම පහේ

ගැබ් වුණ සිසිල එයි ඊතල පරිදි මෙහේ

(අ) මෙහි සඳහන්වන උපමාව හා උපමේය හඳුන්වන්න.

(ආ) 'සිසිල' යන්නට විරුද්ධ පදය ලියන්න.

(x) (අ) 'බුද්ධිමත්'' යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කරන්න.

(ආ) වෛද්‍යවරු රෝගීන්ට ඖෂධ නියම කරති. කර්මකාරකයට හරවන්න.

(ලකුණු 2×10=20)

2. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) ජනාදරයට පත්වෙමින් ඔවුන්ගේ දුක, වේදනාව, සතුට හා තනිකම සුන්දර ආකාරයෙන් ඉදිරිපත් කිරීමට ජන කවියා පොහොසත් විය. ජන කණ්ඩායම්වල බස් වහරත්, ජීවන අනුභූතීන් මිශ්‍ර කර, ජීවන වෘත්තීන් පිළිබඳව ඉඟියක් ලබා දීමත් නිසා මෙම කවි ප්‍රබල මාධ්‍යයක් විය. එසේම සන්නිවේදනය පහසුකර ගැනීමට ද ජන කවි පිටිවහලක් වෙයි.

(ආ) ලොව ශීඝ්‍රයෙන් ක්ෂය වී විනාශ වෙමින් පවතින සම්පතකි 'පානීය ජලය'. සිරිත් විරිත්, ඇදහිලි විශ්වාසවල දී ජල සම්පතට ලැබෙනුයේ සුවිශේෂ ස්ථානයකි. මඟුල්, අවමඟුල් ආගමික කටයුතුවල දී පමණක් නොව ජීවිතයේ නොයෙක් විශේෂ අවස්ථාවන්හි දී ජලය මුල් කොටගත් වත් පිළිවෙත් සිදු වේ. මිනිසාගේ මූලික අවශ්‍යතාවක් වන ජලයට අප සංස්කෘතියේ වැඩි ඉඩක් ලැබෙනවා සේම එය ආරක්ෂා කර ගැනීමේ පියවර පාසලෙන් ම ආරම්භ කරමු.

(ඉ) විද්‍යාව හා තාක්ෂණයෙන් අද ලෝකය ඉහළට ම ගමන් කර ඇත. එසේ ම එකිනෙකා අතර අසමගිය ද ඒ ආකාරයෙන් ම වර්ධනය වී ඇති බවක් ද පෙනේ. ඇතැම් විට ලොවට යහපත් දෑ බිහි කරන තාක්ෂණය ම තවත් විටෙක අයහපත් විනාශයක් ද එක් කර තිබේ. විද්‍යාව හා තාක්ෂණය මිනිසා ඇතුළු පරිසරයට හිතකර ආකාරයට යොදා ගන්නා ක්‍රම හා ආකල්ප වෙනස් විය යුතු බව පෙන්වා දෙන්න.

(ඊ) දැන් වෙලාව පාන්දර හතරයි. හැම පැත්තෙන් ම කළුවර ගලා යන බව පෙනුණි. ඉදිරිපස දොරේ එක පාරටම යමක් වදින ශබ්දයක් ඇසුණි. නිවසේ සියලු දෙනා තද නින්දේ පසුවෙති. 'පහන්' ඇඳෙන් බැස දොර ළඟට කිට්ටු කළේය............. මේ කොටස ඇසුරු කරගෙන නිර්මාණාත්මක රචනයක් ගොඩ නගන්න.

(ලකුණු 25යි.)

3. පහත දැක්වෙන පාඨය වචන 50 - 60 ත් අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව ද සාරාංශය අග යොදන්න.

"පාලිතයන් හා පාලකයන් අතර ගැටුම් සමතයකට" ඉංග්‍රීසි පුවත්පත ආරම්භ වූ බව 1833 දී කෝල්බෲක් ප්‍රකාශ කළත්, සිදු වූයේ එහි විරුද්ධ අංශයකි. ආරම්භයේ සිට විසිවන සියවස මධ්‍ය කාලය දක්වා ම බොහෝ විට සිදු වූයේ පුවත්පතේ ප්‍රධාන කතුවරයා ම, එහි ව්‍යාපාරිකයා ලෙස කටයුතු කිරීමත් සමාජ ගැටුම් පුවත්පත, බිහිවීමේ මූලික හේතුව වීමත් ය.

විසිවන සියවසේ තුන , හතර දශකය පසුවන තුරුම ඇතැම් සිංහල පුවත්පත් භාෂාමය වශයෙන් හෝ නිර්මාණාත්මක වශයෙන් වර්ධනය වූ බවක් නො පෙනෙ යි. ඊට ප්‍රධාන හේතුව ඉංග්‍රිසි භාෂාවෙන් අධ්‍යාපනය ලත් උගතුන් වැඩි දෙනෙකු මේ වන විට පුවත් පත් කර්තෘ ධූරයන් දැරීම විය හැකිය. ඒ නිසා ඔවුන් ඉංග්‍රිසියෙන් සිතා සිංහල භාෂාවෙන් ලිවීම සිදු කර තිබේ. විසිවන සියවසේ තුන්වන (1930) දශකයෙන් පසුව දේශීය, විදේශීය, දේශපාලන, ආර්ථික, සමාජ, සංස්කෘතික සාධක ද පුවත්පත් බිහිවීමට මෙන්ම ව්‍යාප්තිය කෙරෙහි ද බලපා තිබේ. සටන් පාඨ වර්ගයේ සහ දීර්ඝ විස්තරාත්මක සිරස්තල නිර්මාණය ආරම්භය ද එවක දක්නට ලැබේ. ඊට අමතරව ඡායාරූප, චිත්‍ර වර්ණ භාවිතය ද බහුල වශයෙන් පුවත්පතට ප්‍රවේශ වෙයි. වාමාංශික ව්‍යාපාරය, ජාතික නිදහස් සටන, ඉන්දීය නිදහස් අරගලය, දෙවන ලෝක යුද්ධය හා එහි ලොව ප්‍රවණතා, ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයේ නිමාව හා සෝල්බරි ආණ්ඩු ක්‍රමයේ ආරම්භය, දේශීය උගතුන් බිහිවීම වැනි සමාජ, දේශපාලනික සාධක පසුබිමේ සිට පුවත්පත් භාෂාව හා එහි සිරස්තල නිර්මාණය ද වෙනස් වන ස්වරූපයක් දක්නට ලැබේ.

(ලකුණු 10 යි.)

4. පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

තාක්ෂණය මෙතරම් දියුණු කාලයක වුවද, ලෝකයේ කිසිම දියුණු රටක කිරිපිටි පානය නොකරන බව දන කියා ගන්නට අප රටෙහි වැඩි දෙනෙකු තවමත් සමත්ව නැති බව පෙනේ. අඩුම තරමින් අද වන විට උණ හෙම්බිරිස්සාව තරමටම ප්‍රචලිතව ඇති දියවැඩියා රෝගයට පදනම වැටෙන්නේ මෙවැනි පානයන් නිසා බවට දෑ හිතකාමී උගත් වෛද්‍ය විශේෂඥයන් විසින් කරනු ලබන පෙන්වා දීම් පිළිගැනීමටවත් වැඩි දෙනෙකු සූදානම් බවක් නොපෙනේ. එසේ වුවද අද වන විට සමාජය සිසාරා පැතිර ඇති බෝ නොවන රෝගවලට ප්‍රතිකාරයක් වෙමින් ද අනෙක් පැත්තෙන් කිරි පිටි සඳහා කරනු ලබන නිෂ්ප්‍රයෝජන වියදම ඉතිරි කර දෙමින් ද ප්‍රබෝධවත් ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය යහපත් විකල්පයක් සොබාදහම විසින් අපට සපයා දී තිබේ. එය නම් මනුෂ්‍යයාට ඉතාමත් ගුණදායක විවිධාකාර කොළ සහිත ආහාරයන් ය. මෙම කොළ වර්ගවලින් සියයට අනූ නවයක් පමණ ඉබේ හැදුණු ඒවා වීම ආශ්චර්යවත් කරුණකි. එහෙත් සොබා දහමේ ඒ අසිරිමත් තිළිණයෙන් අප තවමත් ප්‍රයෝජන ගන්නේ ඉතා මන්දගාමී අයුරිනි. කොළ කැඳ ගැන කතා කිරීමේ දී අප පළමුවෙන් ම ස්තුති කළ යුතුව ඇත්තේ එය පානයක් ලෙස සකසා ගැනීමට මූලික වූ පැරැන්නන්ට ය. මක්නිසාද යත් ශාක පත්‍රවල කොතරම් බහුල ලෙස අප සිරුරට අවශ්‍ය සංඝටක තැන්පත්ව තිබුණ ද ඒවා අප ශරීරයට උරා ගනු ලබන්නේ තෙල් සමග බව ඔවුන් විසින් ප්‍රත්‍යක්ෂ කරගෙන සිටි නිසා ය. කැඳ වර්ග සාදා ගැනීමේදී ශාක පත්‍ර යුෂ සමග පොල් කිරි මිශ්‍ර කර උණු කිරීම නිසා මෙම විටමින් අඩංගු බීටා කැරොටීන් නම් රසායනිකය අප ශරීරයට උරා ගත හැකි වේ. එසේ වන්නේ පොල් තෙල්වල ඇති පාමටික් ඇසිඩ් සමග මිශ්‍ර වීමෙනි. කොළ මැල්ලුමක් සාදා ගැනීමේ දී ද ගාන ලද පොල් මිශ්‍රකර රත් කර ගැනීමෙන් සිදු කරන්නේ ද මේ අයුරින්ම පොල්තෙල්වල ඇති පාමටික් අම්ලය සමග බීටා කැරොටීන් මිශ්‍ර වී අප ශරීරයට විටමින් වර්ග ලබා දීමය. කොළ කැඳ යනු විටමින් ඌනතාවන්ට පමණක් නොව, සියලුම මන්දපෝෂණ තත්ත්වයන්ට ගුණදායකය.

i. ඡේදයෙන් අවධාරණය කරන ආකාරයට අපට හිතකර හා අහිතකර පානයන් මොනවා ද?

ii. ශාක පත්‍රවල ඇති පෝෂණීය සංඝටක ශරීරයට උරා ගැනීම ගැන පැරැන්නන් ප්‍රත්‍යක්ෂ කරගෙන සිටියේ කුමක් ද?

iii. බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා කළ හැකි දෙයක් ලියන්න.

iv. මෙහි සඳහන් වන රසායනික වර්ගයක් හා අම්ලයක් නම් කරන්න.

v. අර්ථ දක්වන්න.

(අ) විකල්පය (ආ) ආශ්චර්යවත්

(ලකුණු 2×5=10)

5. සිරිපුර, දිරිමිණි මහා විද්‍යාලයේ 10 වන ශ්‍රේණියේ සිසු දරු දැරියන් විසින් ඉදිරිපත් කෙරෙන නව නිපැයුම් අධ්‍යාපනික ප්‍රදර්ශනය විද්‍යාලයේ ප්‍රධාන ශාලාව හා ඒ අවට භූමි පරිශ්‍රයේදී 2025.08.29 දින පෙ.ව. 8.00ට ආරම්භ කිරීමට නියමිතයි. එදින ප්‍රදර්ශනය විවෘත්ත කිරීම සඳහා පැමිණෙන ලෙස දන්වා සිරිපුර අධ්‍යාපන කලාපයේ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා වෙත යවන ලිපිය සකසන්න. (ඔබ විද්‍යාලයේ නව නිපැයුම් සංගමයේ ලේකම් සුසිත් ජයකොඩි යැයි සිතන්න.)

(ලකුණු 15යි)

නැතහොත්,

පසුගිය දිනක ඇති වූ ගංවතුර හා සුළි සුළං හේතුවෙන් ඔබ පාසල අවට ගම්මාන රැසක පාරවල් නාය ගොස් වළවල් හෑරී ගිය ස්ථාන රාශියක් දක්නට ලැබේ. මෙම ප්‍රදේශයේ ඇති ඇතැම් කුඩා නිවාසවල වහළවල් මතට කඩා වැටුණු විශාල ගස් හා අතු නිසා උන් හිටි තැන් අහිමිව ගිය පිරිසක් ද වෙති. හදිසියේ ඇති වූ මෙම ආපදා තත්ත්වය පාසලේ ප්‍රධාන ශාලාවේ වහලයට ද බලපා තිබේ. ආපදා කළමනාකරණය හා ප්‍රතිසංස්කරණ උපකාර සඳහා අවධානය යොමු කරමින් පුවත්පත් විශේෂාංග ලිපියක් සකස් කරන්න.

(ලකුණු 15යි)